# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/PMD/03/41
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2013.01.02

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 01/2013**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු සමාගම්වල
සහ අධිකාරවල සභාපතිවරුන් වෙත

**දේශීය අරමුදල් යටතේ සැපයුම් කොන්ත්‍රාත් සඳහා සහභාගී වන දේශීය ලංසුකරුවන් ඉදිරිපත් කරන දේශීය වශයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ සඳහා ප්‍රමුඛත්වය ලබා දීම**

ඉහත කරුණ සම්බන්ධව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 7.9.6 යටතේ සඳහන් විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරවමි. එහි දක්වා ඇති ප්‍රතිපාදන පරිදි ලංසු ඇගයීමේ ක්‍රියාවලියේදී දේශීය වශයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ සඳහා පහත සඳහන් පරිදි ප්‍රමුඛත්වය ලබා දිය යුතු වේ.

| | | |
|---|---|---|
| 1. | ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකු විසින් සපයන කොන්ත්‍රාත් සඳහා දේශීය වශයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ | 15% |
| 2. | ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන කොන්ත්‍රාත් සඳහා දේශීය වශයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ | 20% |

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී දේශීය නිෂ්පාදකයින් දිරිගැන්වීමේ අරමුණින් දේශීය නිෂ්පාදන සඳහා ප්‍රමුඛත්වය ලබා දීම අවශ්‍ය වී තිබේ. මේ අනුව රාජ්‍ය ආයතන සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී හැකි සෑම අවස්ථාවකදීම අමු ද්‍රව්‍ය, ශ්‍රමය සහ අනෙකුත් සාධක දේශීයව උපයෝගී කර ගනිමින් නිපදවන ලද භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කටයුතු කළ යුතු වේ.

2. මෙහිදී පවත්නා යම් නීතියක, රෙගුලාසියක, චක්‍රලේඛයක හෝ අරමුදල් සපයන ආයතනයන්හි (Donor Agencies) ගිවිසුම්වල කොන්දේසි හා මාර්ගෝපදේශ මගින් (අදාල වන පරිදි) අන් අයුරකින් අර්ථ දක්වා නොමැති අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාවේ තනි පුද්ගල/ තනි අයිතිය ඇති නිෂ්පාදනයන් හෝ සියයට පනහක් (50%) ශ්‍රී ලංකිකයන් ඇතුළත් හවුල් ව්‍යාපාර මගින් නිපදවන ලද හා කම්හලෙන් නිකුත් කරනු ලබන දේශීය නිෂ්පාදන (ඖෂධ හැර) මිලෙහි (ex-works price) 30% හෝ ඊට වැඩි ප්‍රතිශතයක දේශීය ශ්‍රමය, අමුද්‍රව්‍ය හා අනෙකුත් සාධකවල එකතු කළ අගය අඩංගු නිෂ්පාදන දේශීය නිෂ්පාදන ලෙස සලකනු ලැබේ.



පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්